

# Community Connectors

## ආබාධ සහිත බහු සංස්කෘතික පුද්ගලයන් වෙනුවෙන් වන උපකාර

සුදුසු උපකාර ලබා ගැනීම තුළින් පුද්ගලයන්ගේ ජීවිත වෙනස් කිරීමට හැකිය.

## ආබාධ සහිත බහු සංස්කෘතික පුද්ගලයන් NDIS සමග සම්බන්ධ කිරීම

ඔබට ආබාධිත තත්ත්වයක් වේද නැත්නම් National Disability Insurance Scheme (NDIS) වෙතින් ප්‍රතිලාභ ලැබිය හැකි කෙනෙකුට ඔබ රැකවරණය සපයනවාද?

NDIS සමග සම්බන්ධ වීමට සංස්කෘතිකව උචිත සේ සකස් වූ උපකාර, Community Connectors වැඩසටහන විසින් සපයනු ලැබේ.

### NDIS යනු කුමක්ද?

NDIS යනු ආබාධ සහිත පුද්ගලයන්ට සේවා හා උපකාර සපයන රජයෙන් නොමිලේ ලැබෙන සේවාවකි.

### NDIS මට උපකාර වන්නේ කෙසේද?

උපකාර හා සේවාවන්ට මේවා ඇතුළත් වේ:

- ඔබේ එදිනෙදා කටයුතු වෙනුවෙන් උපකාර
- ඔබට සාර්ථකව රැකියාව කිරීමට හෝ කරගෙන යාමට රැකියා ස්ථානයේ දී ලැබෙන උපකාර
- ඔබේ නිවසේ පරිසරය පවත්වාගෙන යාමට නිවසේ වැඩකටයුතු සඳහා ලැබෙන උපකාර
- සංචලන ආධාරක හා/හෝ උපකරණ මිල දී ගැනීමට

### Community Connector යනු කුමක්ද?

සංස්කෘතිකව හා භාෂාමය වශයෙන් විවිධ වූ හා ඉංග්‍රීසි කතා නොකරන පසුබිම්වල පුද්ගලයන්ට NDIS ප්‍රවේශය ලබා ගැනීමට Community Connectors (කමියුනිටි කනෙක්ටර්ස්) උපකාර කරයි.

ඔබ හා NDIS අතර මැදිහත්කරුවකු ලෙස කටයුතු කිරීමෙන් ඔවුන් ඔබට උපකාර කරනු ඇත.

ඔබේ Community Connector වරයාට පහත දැක්වෙන දේ සඳහා උපකාර ලබා දිය හැකිය:

- NDIS සඳහා අයදුම් කිරීම
- ඔබේ ප්‍රදේශයේ NDIS සේවා සමග ඔබව සම්බන්ධ කිරීම
- NDIS සේවාවන් වඩා හොඳින් අවබෝධ කර ගැනීමට හා භාවිත කිරීමට උපකාර සැපයීම.

### ඔබේ ප්‍රදේශයේ Community Connectors සමග සම්බන්ධ වීමට අවස්ථා සැළසීම :

### භාෂණ පරිවර්තකයන් ලබා ගැනීම

ඔබට මෙම පිටුවේ ඇති දෑ වටහා ගැනීමට උදව් අවශ්‍ය නම් (TIS), (**131 450**) ඔස්සේ භාෂණ පරිවර්තන සේවාව අමතා ඉහතින් දක්වා ඇති ඔබේ ප්‍රාදේශීය සේවා සපයන්නා සමග සම්බන්ධ කරන ලෙස ඉල්ලා සිටින්න.

*National Community Connectors වැඩසටහන NDIS, Federation of Ethnic Communities' Councils සහ National Ethnic Disability Alliance හි සහයෝගීත්වයෙන් සිදු වේ. එයට National Disability Insurance Agency වෙතින් අරමුදල් සැපයේ.*

**Fecca.org.au** වෙත හෝ **neda.org.au** වෙත යන්න.

FECCA
Federation of Ethnic Communities' Councils of Australia

NEDA
NATIONAL ETHNIC DISABILITY ALLIANCE

I ♥ ndis